# අපේ ජනකවි



ජී.එච්. අප්සරා අභිමානි රණවීර

# අපේ ජනකවි

ජී.එච්. අප්සරා අභිමානි රණවීර

# අපේ ජනකවි

## ජී.එච්. අප්සරා අභිමානි රණවීර

**කර්තෘගේ වෙනත් කෘති :**

- **රෝමන් (ISBN 978-624-211-077-6)**

**පාසල** : **මහ/විහාරමහාදේවි  බාලිකා විදුහල**

**ඉගෙනුම ලබන පංතිය** : **07 ශ්‍රේණිය**

**කෘතිය පල කරන දිනය** : **25.04.2026**

**ISBN අංකය : 978-624-211-002-8**

# පිදුම

මෙම පොත සෑදීමට මා හට නිති ඔවදන් දෙන

ආදරණීය මාගේ දෙමාපියන්ටද,

මාගේ ආදරණීය අක්කාටත්, නංගීටත්,

ගුණ නැණින් මාව පෝෂණය කරනු ලබන

විහාරමහාදේවි පාසලේ විදුහල්පතිතුමිය

ප්‍රමුඛ ආචාර්ය මණ්ඩලයට ද,

සෙනෙහෙබර අත්තම්මලා දෙදෙනාටත්,

බස පිරික්සමින් ගුරුහරුකම් දෙන සිසිර අත්තාටත්

මෙම පොත සෙනෙහෙ සිතින් පුදමි...

# පෙරවදන



දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරන බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂ්‍යයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදු කරන හේමමාලා උපහාර ගත්කරන ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මාණකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුළු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය ,
පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,  
දියවඩන නිලමේ,  
ශ්‍රී දළදා මාලිගාව  
2026.05.10

# හැඳින්වීම

ජනශ්‍රැතිවල එක් අංගයක් ලෙස සැලකෙන ජන කවිය, අනුරාධපුර යුගය තරම් දීර්ඝ ඉතිහාසයකට නෑකම් කියයි. මේ බව පෙළපොතක සඳහන් වන්නේ සුත්ත නිපාතඅට්ඨ කථාව වන පරමත්ථ ජෝතිකාවේ සඳහන් පාඩමකින් මා කියවා ඇත්තෙමි. පාළුව, කාන්සිය දුරු කර ගැනීමට ගැමියාගේ මුවින් ඉබේටම වාගේ කියැවුණු මේ කවි පැරැන්නන් විසින් අපට ලබා දුන් මහඟු දායාදයකි. ලෝකය කොතරම් තාක්ෂණය අතින් දියුණු වුව ද වර්තමානයේ මිනිසුන්ගේ සිතුම් පැතුම් දියුණු වී නොමැත. ජන කවිය අපගේ සිතට සහයක් ලබා දෙයි. වෙහෙස නිවයි. විටෙක අපගේ දැනුම වර්ධනය කරයි. එමෙන්ම ජීවිතයට වටිනා උපදෙස් රාශියක්ද ලබා දෙන අවස්ථා ඇත.

නිශ්චිත කතුවරයෙක් නොමැති මේ ජනකවි විවේකය මෙන්ම විටෙක විනෝදාස්වාදයක් ගෙන දෙන්නක් වේ. තේරවිලි, කවි ඊට කදිම සාක්ෂියකි. කවියෙන්ම ප්‍රශ්න අසා කවියෙන්ම පිළිතුරු ලබාදෙන මේ කවි කෙතරම් දැනුම ලබා දෙන අංගයක් ද? ගැමියාගේ සැබෑම පෙනුම ඇති සැටියෙන්ම පෙන්වන මේ ජනකවි වර්ග කිහිපයක් අපි හඳුනා ගනිමු.

- පැල් කවි
- පතල් කවි
- නෙළුම් කවි
- ගැල් (කරත්ත) කවි
- පාරු කවි
- කමත් කවි
- රබන් කවි
- උඩැක්කි කවි
- කුඹල් කවි

යනාදී වශයෙන් බොහෝ ජනකවි වර්ග ඇත.

මේවා කටින් කට එදා සිට අද දක්වාම පරම්පරාවෙන් පරම්පරාවට පැමිණෙමින් අදටත් යම් ප්‍රමාණයක් ඉතිරිව ඇත්තේ මේ පිළිබඳ උනන්දුවක් දැක් වූ ලේඛක පරපුරක් සිටි නිසාය.

මේ ජනකවි උගත් නොවූ මෙන්ම වැඩිදුර අධ්‍යාපනයක් නොලත් ගැමි ජනයා අතින් බිහිවුණු කවි පිළිබඳ හොඳ දැනුමක් තිබුණු බවනම් අප හැම දෙනාටම පෙනෙන කරුණකි. වී ගොවිතැන තම ජීවන උපාය ලෙස සකසා ගත් අතීත ගැමියා විවිධ කාර්යන්වලදී වෙහෙස දුරු කරවා ගැනීමට කවි කීහ.

මාගේ කෘතිය තුළින් මා බලාපොරොත්තු වන්නේ වියැකී යන ජනකවිය විශේෂයෙන්ම දුර්ලබ අසා නැති ජන කවි වැඩිහිටියන් සහ පැරණි පොතපත ඇසුරෙන් ලියා තැබීමයි. මේ අතරට මා විසින් සාදන ජන කවි ද ඇතුළත් ය.

# පටුන

පිටු අංක


| | | |
|---|---|---|
| 1. | අවුරුදු ඇවිල්ලා (මා සැදූ කවි) | 1 |
| 2. | මගේ රට (මා සැදූ කවි) | 2-3 |
| 3. | උදෑසන අසිරිය (මා සැදූ කවි) | 4 |
| 4. | නෙළුම් කවි | 5 |
| 5. | පාරු කවි | 6 |
| 6. | පැල් කවි | 7 |
| 7. | කරත්ත කවි | 8 |
| 8. | පතල් කවි | 9 |
| 9. | කමත් කවි | 10 |
| 10. | ඔන්චිලි කවි | 11 |
| 11. | රබන් පද | 12-13 |
| 12. | තේරවිලි කවි | 14 |
| 13. | කුඹල් කවි | 15 |
| 14. | ඔළිඳ කවි | 16 |
| 15. | කළගෙඩි නැටුමේ කවි | 17 |
| 16. | කුළු නැටුමේ කවි | 18 |
| 17. | පොල් කෙළියේ කවි | 19 |
| 18. | උපදේශාත්මක කවි | 20 |
| 19. | විනෝදජනක කවි | 21 |
| 20. | පැදුරු කවි | 22 |
| 21. | ස්තූතිය | 23 |

# අවුරුදු ඇවිල්ලා

ඇත ඇත ගහමුදුනේ කොහා හඬාලා
කැවුම් කොකිස් මුං අලුවා රහට හදාලා
කවි කියමින් ගැහැනු ළමයි පැද ඔංචිල්ලා
අවුරුදු එන බව කියමින් එරබදු පිපිලා

කොයි කාගෙත් තරහමරහ අමතක කරලා
නැගම් යති නෑදෑයින් සතුටින් එතිලා
පුංචි පැටව් හඬ හැම දසතින් විහිදීලා
අවුරුද්දේ අසිරිය ගම්මානෙ පිරිලා

දොං තරිකිට තාක්ක දොං රබන් ගසාලා
චට පට චිරි චිචිරි චිචිරි රතිඤ්ඤා දමලා
සූරිය උදාවේ නැකතින් කිරිබත් කාලා
සමගි සමාදානෙන් අවුරුදු සමරලා




# මගේ රට

සීතල රිදී දිය වැල් ඇදී ඇදී හැලෙයි
උස්කඳු වළල්ලෙහි මැද රට මුර කරයි
මල් ගොමුවේ කිචි බිචි හඬ පතුරාලයි
මේ හැමදේ සිරිලක් මව ඔප කරලාලයි

සමුදුරු පරදනා වැව් පිරි මගේ රට
කෙත්වතු සරු සාර වී ඇති මගේ රට
කාටත් නොදෙවෙනියි සිරිලක මගේ රට
රැකගම් සදාකල් මැණිකකි මගේ රට


පැරකුම් දුටුගැමුණු මහසෙන් රජුත් එදා
සව් සැප සිරින් එක්සේසත් කළා සදා
වෙළඹක වගේ අභනුන් කෙළිබිමේ මෙදා
කිතුගොස නංවනවා සිරිලක් මව සැමදා

කුමරතුඟු සිරි රහල් හිමි වැනි පඬිවරුන් එදා
රට ගැන ආදරෙන් පැනෙන් කවි සාදා
රැකගත්තා පණ සේ සිරිලකම එදා
රකිමු සදා මගේ පණ හැර ගියත් සදා

සීගිරි ගිරි ශිඛර සිඹිනා        වලාකුළු
අවුකන සමාධිය හිත සනසයි        යාළු
ථූපාරාම, රුවන්වැලි සෑ කර        එකළු
හෙළ දිවයිනෙ කලා කෙත සරු        කෙරුවාලු

සාරධර්ම දැන් දසතම        වැනසීලා
මිනිසුන් නොමිනිසුන් වී රට        වනසාලා
ගහකොළ සතා සිවුපාවන්        වනසාලා
රකිමු  රකි මු අප මව් බිම        එක්වීලා







# උදෑසන අසිරිය




අහසේ විහඟුන් පියඹයි
කූඹි රැළත් කෑම සොයයි
සමනලයින් මල් පැණි බොයි
ගස්වල මල් පිපී නටයි

කන්ද උඩින් හිරු එබිලා
පුංචි ළමයි අවදි වෙලා
සුදු පාටින් සැරසීලා
පාසල් යයි සිනාසලා

මල් පෙතිවල පිනි බින්දු වැටීලා
මල් සුවඳට මී මැස්සෝ ඇදීලා
බටිති මලිති සැම සින්දු කියාලා
පරිසරයම දැන් ලස්සන වීලා



සීතල පිණි දිය කොළ මත වැටිලා
ගොවියා උදැල්ල කරේ තියාලා
ටිකිරි මැණිකෙ අර ඇඹුල ගෙනැල්ලා
හිමිදිරි උදයක අසිරි  ගෙනැල්ලා



# නෙළුම් කවි

සුබා ගුණැති රුසිරු අඟනන්නේ
සබා මැදදි කවි පද පවසන්නේ
විභාගයෙන් එන අය විමසන්නේ
බඹා මැවූ රුවදෙන් මෙලදුන්නේ

උදේ සිටන් වකුටු කොන්ද දිග ඇරපල්ලා
අතේ තියෙන නෙළාපු වල් විසි කරපල්ලා
ඉණේ තියෙන ලේන්සු පොඩි අතට ගනිල්ලා
බුදුන් දහම් සඟ සරණින් ගොඩට යමල්ලා

සිඳුරු නැතුව උස් අඟනෝ සැදිලා
කිඳුරු නාදයෙන් ඕසේ ඇදලා
ගැඹුරු වචන කවිපද පවසාලා
කුඹුරු නෙළති තලපත් ඉසලාලා



මෙලෙසින් රුබර අඟනෝ සැදිලා
කයියෙන් කයියට අත්තටු ගෙවලා
යායේ හැම තැන කුඹුරු නෙළාලා
ඉවර කරති සතොසින් හැම එකලා

## පාරු කවි

ඔන්න මලේ ඔය නාමල නෙළා  වරෙන්
අත්ත බිඳෙයි පය බුරුලෙන් තබා  වරෙන්
කැලණි ගඟේ ඔරු යනවා බලා  වරෙන්
සාදුකාර දී ඔරුවක නැගී  වරෙන්

මාතර ගඟේ සිටිනා කිඹුලිගෙ  පැටියා
තල්ල සුදුයි බෙල්ලේ ගෝමර  කැටියා
යන එන ඔරු පාරු නවතාගෙන  සිටියා
මිනී නොකයි මාතර කිඹුලිගෙ  පැටියා

සූරිය උදාවන තුරු පිණි  බැවිල්ල
පාරුව පදින තුරු සයුරේ  සෙලවිල්ල
මාරුව බල බලා සිත යට  කැරකිල්ල
කාරිය කෙරෙන තුරු කාගෙත්  රැවටිල්ල

මලේ මලේ තැඹිලිය වැන්න පොල්  මලේ
රළේ රළේ මූදෙන් දමන දිය  රළේ
බලේ බලේ රාසිං දෙවියන්ගෙ  බලේ
ගලේ කොටුව බැන්දයි තිරිකුණා  මලේ

# පැල් කවි

හේනේ පැලේ මා විදිනා සුරුක්කන්
ඌරෝ ඇවිත් වට පිට කරති සක්මන්
වැටටත් උඩින් උන් අල්ලන මලක්කන්
අපොයි ! මගේ කිරි වදිනා කුරක්කන්

ලස්සන හිමවතේ මා වී පැසෙන්නේ
දුක්දෙන අලි ඇතුන් පන්නා හරින්නේ
රැක්මෙන දෙවියනේ වෙල බත බුදින්නේ
දුප්පත්කම නිසයි මම පැල් රකින්නේ

යල මහ දෙකටමයි ගොවිතැන් කරන්නේ
පව පින අනුවමයි අස්වනු ලැබෙන්නේ
හේනේ පැලේ ඉඳ පැල් කවි කියන්නේ
රුහුණේ ගොවියොමයි ගොවිතැන් කරන්නේ



වෙල හොඳ මොකද යල මහ පාලු වේනම්
පැල හොඳ මොකද පොද වැස්සට තෙමේනම්
මල හොඳ මොකද අතු අග පරව යානම්
ලිය හොඳ මොකද ඉසි ගෝමර මැකේනම්

# කරත්ත කවි

කළුගල් තලාලයි පාරට	දමන්නේ
එමගල් පැගිලයි ගොන් කුර	ගෙවෙන්නේ
ගොනා නෙවෙයි හරකයි බර	අදින්නේ
කිරි ගල් පොත්ත කන්දයි අපි	නගින්නේ



තණ්ඩලේ දෙන්න දෙපොලේ	දක්කනවා
කටු කැලේ ගාලේ නොලිහා වද	දෙනවා
හපුතලේ කන්ද දැකලා බඩ	දනවා
පව්කළ ගොනෝ ඇදපන් හපුතල්	යනවා

එගොඩ ගොඩේ නා කණුවේ බැන්ද	ගොනා
මෙගොඩ ගොඩේ සපු කණුවේ බැන්ද	ගොනා
දෙගොඩ තලා යන වතුරට පැන්න	ගොනා
අනේ මගේ රන්මුතු වල්ලියා	ගොනා

බණේ කොහොම කිව්වත් පව් පල	දෙනවා
පිනේ අරුම නොසිතා අපි පසු	වෙනවා
ගොනෝ නුඹත් කළ පව් දැන්	තේරෙනවා
අනේ ගොනෝ ඇදපන් මීගමු	යනවා

## පතල් කවි

දඩිබිඩි ගගා කරනා වැඩ රට    වටියේ
රට වෙඩි දමා කඩනා කළුගල්    කැටියේ
ගලයට තිබෙන මිනිරන් ගන්නා    සැටියේ
ගොඩ වැඩ කරන අයට දෙන්නෙත් අඩු    පඩියේ

ආවා තමා පතලේ වැඩ    කරන්නට
බැරුවා තමා ඉණිමං වල    බැසයන්ට
මැරුවා වගේ ළඟ ඉඳගෙන කියන    කොට
බැරුවා දෙවියනේ කළුගල්    බිඳින්නට

කස්තුරි කපුරු දාං අල්ලා මල්    පැලට
ඉස්සර වෙලා පිං දීලා    දෙවියන්ට
තිස්පැය හමාරක් නැත තව    එළිවෙන්ට
තිස්පැය දෙකක් වැඩ ගන්නා    රුපියලට

දබරේ කරකවා අත් දෙක    වෙව්ලනවා
නිතරම ඇවිත් ලෝඩර දත්මිටි    කනවා
වතුර ඇදල අත්වල කරගැට    එනවා
මිතුර පතලෙ දැක්කම මගෙ බඩ    දනවා

# කමත් කවි

දැකැත්තක් අලුබෝවක් හක්ගෙඩියක් ගෙන
කදුරු කොළ ද කෙවිට ද ගොන් බැත පෝරුත් ගෙන
හරක් රැගෙන බුලත් රැගෙන වෙන අඩු බඩු ගෙන
කමතට යමු ගොවියනි අපි අතවැසි ගෙන

ගොනා නිකම් බකිරි බතා
උගෙ කන්වැල් වෙහෙර වතා
වෙහෙර සතක උස මහතා
එපමණ උඩ බැත දෙවතා

ගොන් යන්නේ කඳුබොඩලූ
ගලතන්නේ කල වැළලූ
පළදින්නේ මුතු පබලූ
වළඳන්නේ කිරිම දුලූ



කමතෙ ගොයම් මැඩ වෙන කොට
ගණන් බලා සැම පදමට
හැමෝම ඉඳ කමත ට
නමස්කාර කර කමත ට

# ඔන්චිලි කවි



පාන් කිරිත්තී පොල් අඹරනවා
ඒකිගෙ පැටියෝ කඹේ නටනවා
පන්කොළ පෙට්ටිය ළිඳේ කොටනවා
කං කොට නිලමේ කුඹුරු තෙමෙනවා

ගෙලේ සොඳුරු රූ සිරි ළඳ නුඹලා
රැළේ තරුණ සළෙලුන් වෙත නොබලා
ගෙලේ පුරා ඇටවැල් ගෙන බැඳලා
ලොලේ සිතින් පලයල්ලා පැදලා

පුරවර ඔද බැඳ රන් ඔන්චිල්ලා
දුරයන තරමට පුදුම නොවෙල්ලා
වැර සර පුරමින් තව පැදපල්ලා
සුරපුර දෙවියන් රකුමෙ සියල්ලා

අට දෙන අට කොණ වාඩි වෙයල්ලා
සිටගෙන දෙදෙනෙක් පොලු ගා පල්ලා
වව්ලන් ලෙස කැරකෙන ඔන්චිල්ලා
අපිත් පදිමු දැන් රන් ඔන්චිල්ලා

# රබන් පද

උඩපල ගත්තත් වට්ටක්කා
බිම පල ගත්තත් වට්ටක්කා
උඩ පල ගත්තත් බිම පල ගත්තත්
පුංචි පුංචි ගැට වට්ටක්කා

එගොඩ ගොඩෙත් රත්තරං
මෙගොඩ ගොඩෙත් රත්තරං
එගොඩ ගොඩෙත් මෙගොඩ ගොඩෙත්
ඇතෙක් බරට රත්තරං

රන් රඹුටන් ගස් දෙකයි
වලි කුකුළන් පස් දෙනයි
උන්ගෙ කරේ බොත්තමයි
බලන්න හරි ලස්සනයි



තෙලෙන් බැද්දත් කොබෙයියා
කිරෙන් බැද්දත් කොබෙයියා
තෙලෙන් බැද්දත් කිරෙන් බැද්දත්
කොබෙයියා බොල කොබෙයියා

නින්ද ගොහින් රුං තරිකිට

නින්ද ගොහින් රුං තරිකිට

හනික නැගිටපන්

තක දොං හනික නැගිටපන්

බොලං කුණු ගන්දි - කඩන් තොගෙ හන්දි

මරක්කල බොන්ඩ් - ගෙනෙන් මගෙ සල්ලි

වඳුරත්තා බොල වැදිරිත්තා

වඳුරත් වැදිරිත්තා

වැදිරිගෙ හැත්තට

හැට්ට මහන්නට

වඳුරත් වැදිරිත් ඉඳ ගත්තා

කොක්කු දෙදහසක් ඇවිදින් පුත්තලමේ දොං

තවත් දෙදහසක් ඇවිදින් අතරමගදී දොං

කොකා කරපු නින්දාවට

කෙකී ගියැයි වෙල් මාවට

කොක්කු පුතේ වෙල් මාවට

කොක්කු පුතේ කෙක් වළල්ල

උදළු මිටේ රිදී විල්ල

ටිකක් නටාපන් බලන්න

ටිකක් නටාපන්

# තේරවිලි කවි

මොණරෙක් සිටී දස අත පිල් විදාගෙන
කොකෙක් සිටී කඳ මැද්දෙන් බදාගෙන
ගෙඩිකති, ලෙලි නොකති, හැම දෙන බෙදාගෙන
මෙතුන් පදේ තෝරා පවසන් සැණින

දස අත පිලය කීවේ රඹ ගසය මලේ
කඳ මැද බදා ඉන්නේ රඹ කැනය මලේ
ලෙල්ල හැර කෙසෙල් ගෙඩි හැම කනව බොලේ
මෙතුන් පදේ තේරුවෙ නැණයන්ට මලේ

ගෙඩියේ ඇතුළ මිණිමුතු සපිරුණු ලෙසය
වැඩියේ ගනිති මල් පොතු රෝගෙට ඇසය
ගෙඩියේ පැහැය රන් කලසට සමානය
සකියේ මෙම ගෙඩිය තෝරනු නොව සැකය

පිදුම් නොමැත මෙම ගස පිරි මලින් අද
යසින් මෙහෙයි ඇට මිරිකා කරති පුද
එයින් මෙනුඹ පවසන ගෙඩියේ හැඩ ද
දෙළුන් පලය බව කියනෙමි දනු සුහද

# කුඹල් කවි

අරුණෝට පළමුව පිබිදී පැසගෙන මැටිපොළ දෙසට යතෙයි
පැස පිස දමලා මැටිපොළ පාදා ඉටු දෙවියෝ වඳිතෙයි
දියකඩ ඇදලා තොසිනි අතට ගෙන වළ ඇතුළට බසිතෙයි
දෙඉවුර නොකඩා මැටිකඳ බිඳලා පැස පුරවා ගනිතෙයි

බිඳලා මැටි කඳ බැඳගෙන බරටම මිදුලේ ගොඩ කරතෙයි
ලිහලා කැට එක විතරට පොඩිකර මා පැදුරේ අව්වේ වනතෙයි
වේළාගෙන මැටි ගල්කැට වෙන්කර වනේ
කොටා කුල්ලෙන් පොලතෙයි
පොලලා ගත් මැටි එක පමණට දිය ගහලට අනලා කැටි කරතෙයි

එකින් එකට මැටි කැට සුරතට ගෙන පෝරුව මත තබතෙයි
වමතින් පෝරුව දැන පමණට කරකවමින් දකුණෙන් ඉදි කරතෙයි
බඳුන් පමණ හැඩ තල දැනගෙන විතරට අත තද කර ගනිතෙයි
ඉදින් මෙලෙස පමණට ඉදිවෙන කොට පන්නිල බිඳලා හැඩ ගසතෙයි

# ඔළිඳ කවි

ඔළිඳ තිබෙන්නේ කොයි කොයි දේසේ
ඔළිඳ තිබෙන්නේ බංගලි දේසේ
ගෙනත් සදන්නේ කොයි කොයි දේසේ
ගෙනත් සදන්නේ සිංහල දේසේ

ඔළිඳ වැපුරුවයි බලකොයි නෑනෝ
එම්පෙති වෙච්චද බලකොයි නෑනෝ
දෙපෙති වෙච්චද බලකොයි නෑනෝ
තුන්පෙති වෙච්චද බලකොයි නෑනෝ

රැන් ඇදිච්චද බලකොයි නෑනෝ
ගසට පලච්චද බලකොයි නෑනෝ
මල් හටගත්තද බලකොයි නෑනෝ
පලු හටගත්තද බලකොයි නෑනෝ

ඔළිඳ නෙළන්නට මොකක් ගෙනෙන්නේ
රත්තරනෙන් රන් කෙක්ක ගෙනෙන්නේ
ඔළිඳ දමන්නට මොකක් ගෙනෙන්නේ
රත්තරනෙන් රන් හෙප්පු ගෙනෙන්නේ

# කළගෙඩි නැටුමේ කවි

ජේළි ගැසී අඟනෝ සැරසීලා
නීල වරල කුසුමන් ගවසාලා
කෝල නොවී සබ මැදට වැදීලා
බාල ලියෝ කළ පිඹිති සැදීලා



අදිමින් සුදු සේලේ රැළි අල්ලා
බදිමින් වරලස සේ සිකිපිල්ලා
රිදී දිලෙන තෝඩුත් කන එල්ලා
සැදී ලියෝ කළගෙඩි පිඹපල්ලා

සැදී ඉඟට සේලය රැළි අල්ලා
රිදී දිලෙන තෝඩුත් කන එල්ලා
බඳී වරලෙ මල් ගවසා පල්ලා
සැදී ලියෝ කළගෙඩි පිඹපල්ලා

උදයට ඉරු දෙවියන් වැඳ පල්ලා
පොළවට මිහිකත දෙවි වැඳපල්ලා
සබයෙන් අවසර ඉල්ලා ගල්ලා
කළය පිඹින්නට බෙර ගහපල්ලා

# කුළු නැටුමේ කවි

රන්ගිරි මුදුනේ හිරු බැබළෙන්නේ
වල්ලි ළඳුන් තනි තනිවම එන්නේ
අව්වද වැස්සද කියා බලන්නේ
කුල්ල අරන් අපි නැටුමට එන්නේ

වටක් සදිසි බටකොළ වියපු වල්ලියේ
මටත් බලන්නට සව්දම් ගැසූ ලියේ
මෙරට ළඳුන් කුළු හරඹට ලැව්ලි ලියේ
පැරකුම් රජුගේ දූව නවරත්න වල්ලියේ

ඈත සිටන් එන්නී සෙල්ලි සෙල්ලියේ
මෑත සිටන් එන්නී සෙල්ලි සෙල්ලියේ
කරේ බැන්ද සවලම් වැල නොසෙල්ලියේ
පැරකුම් රජුගෙ දූව නවරත්න වල්ලියේ

මුදුනට වරළස පීරා බැන්දේ
ගෙලවට මිණිමුතු මාල ත පැළැන්දේ
දකොට සළු පිළි ඉණවට ඇන්දේ
කදිමට කුළු ගෙන රඟදෙමු ලන්දේ

## පොල් කෙළයේ කවි

උරමාලා සඳ වැඩම කරනවා
පෙර වරමට අප සිරි රැක දෙනවා
තිර කොට ඔබ අණ සිරස දරනවා
පොර පොල් කෙළියට වරම් ලැබෙනවා

වැඳ දෙවියන් හට වරම් ලැබෙනවා
උඩු පිලයේ පොල් බිඳී තිබෙනවා
තෙද මිණි හළඹෙන් සමා ලැබෙනවා
පොල් කෙළියට වස් නැත දුරුවෙනවා

සෙල්ලන් සිරි පද මෙ අප රකිනවා
පුල්වන් දෙව් රජ වරම් ලැබෙනවා
පුල් පියුමක් දෙව් සුරත දරනවා
පොල් පූජාවට වරම් ලැබෙනවා

වඳුරු වසංගත ලෙඩ දුර වෙනවා
අඹෙන් මලෙන් පත්තිනි උපදිනවා
සිරි පතුලට පිට ඔප්පු කරනවා
පොර පොල් කෙළියට වරම් ලැබෙනවා

# උපදේශාත්මක කවි

බිම යනු බැරි එකා උඩකට නගිනවද
නොබිඳෙන වළං හැම ගෙදරකම තියෙනවද
පට්ටා ගන්න හැකි කළුගල් තියෙනවද
දිලිසෙන සියලු දේ රත්රන් වෙනවාද

නයි පැන දුවනවලු අඳු කොළ දකින කල
නුගත්කම තමයි හැම දේකටම මුල
කනාමැදිරියාගෙන් දැල්විය හැකිද හුල
ගහදත් අයට කුමකට පෙන්වමි ද කොළ

ගුල්ලෝ ගසා තිබුණොත් පිත්තල පොල්ල
නොබලම විසිකරනු උම්බලකඩ මල්ල
කොපමණ සිටියමුත් තම නෑදෑ ගොල්ල
තම අත පමණි තම සිරසට සෙවණැල්ල

පැණි කා මැරෙයි බැස ඇඹලය පැණි හැළියේ
හැංගී මූණු බැන්දත් නටනව එළියේ
ඔයකට මදිද ඇසුවලු තරමට බලියේ
බේදව නැද්ද බත්කන අය එක හැළියේ

# විනෝදජනක කවි

බටිය බොල බටිය බොල බටීයේ
ගෙයි වැඩපොළ මොකකුත් බැරි මොටීයේ
දීග කන්ඩ මතුවට නම් වටීයේ
රොටිය නිකම් ඔක්කොම අමු පිටීයේ

අයියයි මමයි අකුරට යන කලට
කුළු මීමෙක් ආවයි අපෙ ඉස්සරට
වටපිට බැලිමි ගසකුත් නැත නගින්නට
පිට පොට ගසා නැග්ගෙමි තුත්තිරි ගසට

මෙහෙව් රටේ රංචාගොඩ ඉපදීලා
රුහුණු රටට මා දීලා ඉලව්වේ
දෙමට පොතු කකා කට හම යන්නා සේ
සැම දෙවියන් මගෙ වාහේ රකෝ් රකෝ්

අහස උඩින් කළුවන් බළලෙක් ඒලූ
මුහුද මැදින් රථයක් පැදගෙන ඒලූ
අලියෙක් කටින් හිවලෙක් ඩැහැගෙන ඒලූ
මීමෙක් ගොසින් වැලයක් බාගෙන ඒලූ

# පැදුරු කවි

වටිනා කෙනෙකි බැලුවෝතින් ඔබ මිතුරු
ඔබ සිටිනා ගෙදර බැලුවෝතින් ඉතා ගරු
වටිනා කෙනෙකි පද බැඳ කීවේ මිතුරු
මිටියේ අකුලලා නම් ඇත හොඳ පැදුරු

විලකට ගොසින් පන් උදුරා ගෙන එන්නේ
මිදුලේ දමා අව්වේ වේලා ගන්නේ
මඩුවෙයි දැන් පැදුරක් මම පුරන්නේ
පැදුරේ ගැටිය ඇයි ඇද කෙරුවේ නෑනේ

බොහෝ කල් නොගොස් කාටත් වෙයි නපුරු
කාටත් මෙහෙම ඇස් දෙක නොපෙනෙයි නපුරු
නාමල් කුමරියන් වියනා හොඳ පැදුරු
ඇහිදල් බෝය නැනේ මිණිවන් පැදුරු

පැදුර ඉසානෝ ඉසිවරයෝ වෙසෙතී
පැදුර පයානේ මිහිකත් දෙවි වෙසෙතී
පැදුර සිව් කොනේ සිව්රන් දෙව් වෙසෙතී
මේ පැදුරේ සමයන් දෙන්නට බය නැතී

# ස්තූතිය

මෙම පොත සැදීමේදී මා හට උදව් කළ, මා මේ සඳහා යොමු කළ කිහිපදෙනෙකු පිළිබඳ සටහන් කර තබමි. මගේ අක්කා අනුසරා අභිෂේකකි රණවීරත්, තලාතුඔය විජය කලායතනයේ අධිපති ජී.එච්. විජේවික්‍රම මහතාත්, පොඩි අත්තම්මාත්, ආදරණීය අත්තම්මලා දෙදෙනාත්, මගේ දෙමව්පියන් වගේම මගේ පාසලේ සිංහල විෂය භාර තනුජා ගුරුමෑණියනුත් ඒවගේම නිරන්තරයෙන් පොත් ලිවීම පිළිබඳ ගුරුහරුකම් දෙන සිසිර ගමගේ සීයාටත් බෙහෙවින් ස්තූතිවන්ත වෙමි.

# පසුවදන



අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂ්‍යයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිශීලනය කළ යුතු බව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබා දිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වා ගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් "හේමමාලා උපහාර" ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත් වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුග මෙහෙවරක් ඉටු කළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලමෙතුමන් ඇතුළු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සත්කාරය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
(ව්‍යාපෘති නිර්මාතෘ)